# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/17 - 2023 නොවැම්බර් මස 22 වැනි බදාදා - 2023.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

1966 අංක 13 දරන පනතින්, 1979 අංක 56 දරන පනතින්, 1982 අංක 13 දරන පනතින්, 1988 අංක 84 දරන පනතින්, 1995 අංක 23 දරන පනතින් සහ 2009 අංක 65 දරන පනතින් සංශෝධනය කර ඇති, 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වන) වන සංරක්ෂණ ආඥාපනතේ 64. (1) වගන්තිය සමග කියවිය යුතු 4(2) වැනි වගන්තිය යටතේ වූ නියමය.

නියමය

451 වන අධිකාරය වූ වන සංරක්ෂණ ආඥාපනතේ 4(2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය, නීතීඥ පවිත්‍රා වන්නිආරච්චි වන මම, වර්ෂ 2012 ක් වූ දෙසැම්බර් මස 06 වන දිනැතිව නිකුත් කරන ලද අංක 1787/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් රක්ෂිත වනාන්තරයක් ලෙසට ප්‍රකාශයට පත් කරන ලද ගුරුගොඩකන්ද රක්ෂිතයෙන් පහත උපලේඛනයේ සඳහන් හෙක්ටයාර් 2.0235 ක් වූ කොටස වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 01 වන දින සිට රක්ෂිත භාවයෙන් නිදහස් කරමි.

නීතීඥ පවිත්‍රා වන්නිආරච්චි,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 නොවැම්බර් මස 21 වැනි දින,
රාජගිරිය,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාවේ, ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 22A බලගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අග්ගලාඋල්පත ගමෙහි පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් 2023 අගෝස්තු 08 වැනි දින සකස් කරන ලද අංක B/MGH /2023/1020 දරන අනුරේඛනයෙහි නිරූපිත කැබලි අංක A වශයෙන් හඳුන්වන තලාවතැන්න නමැති ඉඩම් ඒකාබද්ධ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.0235 ක් වූ විශාලත්වයෙන් යුතු පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් ප්‍රමාණය වේ.

1A - G 40800 — 56 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක A - තලාවතැන්න ඉඩම :**

*උතුරට* : අ.ග.පි. 614 හි කැබලි අංක 178 (කොටසක්) සහ කැබලි අංක B මාර්ගය සඳහා වෙන්කළ කොටස

*නැගෙනහිරට* : කැබලි අංක B සහ අ.ග.පි. 614 හි කැබලි අංක 178 (කොටසක්);

*දකුණට* : අ.ග.පි. 614 හි කැබලි අංක 178 (කොටසක්);

*බටහිරට* : අ.ග.පි. 614 හි කැබලි අංක 178 (කොටසක්);

**ප්‍රමාණය (හෙක්) : 2.0235**

EOG 11 - 0218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.